මූලධර්ම
ප්‍රකාශනය
ජූනි 2010

Nestlé

Good Food, Good Life

# නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්ම



මූලධර්ම
ප්‍රකාශනය
ජූනි 2010

# Pr

**කතෘත්වය/නිකුත් කිරීමේ අංශය**
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි

**ඉලක්කගත පිරිස**
සියළුම සේවකයන්

**සම්බන්ධිත සමූහ මූලධර්ම ප්‍රතිපත්ති/තත්වයන් හෝ මාර්ගෝපදේශන**
ව්‍යාපාර පවත්වාගෙනයාමේ නීති සංග්‍රහය,
නෙස්ලේ කළමනාකරණ සහ නායකත්ව මූල ධර්ම

**තොරතුරු තැන්පතුව**
සියලුම නෙස්ලේ මූලධර්ම සහ ප්‍රතිපත්ති, තත්වයන් සහ මාර්ගෝපදේශන
http//intranet.nestle.com/nestledocs හි
මධ්‍ය අන්තර්ජාල තැන්පතුවෙන් ලබාගත හැක.

**ප්‍රකාශිත දිනය**
ජූනි 2010

**හිමිකම් සහ රහස්‍ය භාවය**
මෙම ප්‍රකාශනයේ අඩංගුදේ නිසි අවසරයකින් තොරව ප්‍රතිනිර්මාණය නොකළ යුතුය.
සියළු හිමිකම් සීමාසහිත නෙස්ටෙක්, 1800 වෙවේ, ස්විට්සර්ලන්තය සතුවේ.
© 2010 සීමාසහිත නෙස්ටෙක්.

පරිවර්තනයේ අනුමානයන් සහ වෙනස්කම් ඇතොත්
ඉංග්‍රීසි සංස්කරණය තුළින් නිසි රැකවරණය ලැබේ.

**සැලසුම්කරණය**
සීමාසහිත නෙස්ටෙක් සාමූහික අනන්‍යතා සහ සැලසුම්,
වෙවේ, ස්විසර්ලන්තය

**නිපැයුම**
අල්ටවයා ස්විස්

**කඩදසි**
මෙම ප්‍රකාශනය මුද්‍රණය කොට ඇත්තේ වනාන්තරය සුරකිමින් සහ අනෙකුත්
සම්පත් භාවිතයද අරපිරිමැස්මෙන් නිපදවන ලද, වන සත්කාරක සභාව (FSC)
විසින් සහතික කළ BVS කඩදසිවලය.

# පටුන


3 **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කැපවීම**

5 **ස්ථාවරත්වය සඳහා පදනම සහ හවුල් වටිනාකම් නිර්මාණය කිරීම**

6 **ව්‍යාපාර මෙහෙයුම් මූලධර්ම දහය**
පාරිභෝගික
1 පෝෂණය, සෞඛ්‍ය සහ සුවතාවය
2 තත්ත්ව ආරක්ෂණය සහ නිෂ්පාදන සුරක්ෂිතතාවය
3 පාරිභෝගික සන්නිවේදනය
මානව අයිතීන් හා ශ්‍රමික ක්‍රියාකාරකම්
4 අප ව්‍යාපාරික කටයුතුවල මානව අයිතීන්
අප සේවක පිරිස
5 නායකත්වය සහ පෞද්ගලික වගකීම්
6 සේවා ස්ථාන තුළ සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යාරක්ෂාව
සැපයුම්කරුවන් සහ ගනුදෙනු කරුවන්
7 සැපයුම්කරු සහ ගනුදෙනුකරු සබඳතා
8 කෘෂි සහ ග්‍රාමීය සංවර්ධනය
පරිසරය
9 පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යාම
10 ජලය

8 **විස්තරාත්මක තොරතුරු සහ සාමූහික ප්‍රතිපත්ති සඳහා සබඳතා**
8 පාරිභෝගිකයින්
9 මානව අයිතීන් සහ ශ්‍රමික ක්‍රියාකාරකම්
10 අප සේවකයින්
11 සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන්
12 පරිසරය

13 **විගණනය.**

# ව්‍යාපාරික මෙහෙයුම් මූලධර්ම දහය

## පාරිභෝගික

### 1
**පෝෂණය, සෞඛ්‍යය සහ සුවතාවය.**

පෝෂණය, සෞඛ්‍යය සහ සුවතාවය සඳහා නෙස්ලේ මූලධර්මයන්.

### 2
**තත්ත්ව ආරක්ෂණය සහ නිෂ්පාදන සුරක්ෂිතතාවය.**

නෙස්ලේ තත්ත්ව ප්‍රතිපත්තිය.

නෙස්ලේ පෝෂණ තත්ත්ව ප්‍රතිපත්තිය.

### 3
**පාරිභෝගික සන්නිවේදනය.**

පාරිභෝගික සන්නිවේදනය පිළිබඳ නෙස්ලේ මූල ධර්ම.

පෝෂණ සහ සෞඛ්‍ය හිමිකම් පිළිබඳ නෙස්ලේ ප්‍රතිපත්තිය.

නෙස්ලේ පෝෂණ ආකෘති පද්ධතිය.

නෙස්ලේ පෝෂණ මාලිමාව.

මව්  කිරි ආදේශකයන් අලෙවිය සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාත්‍යන්තර නීති සංග්‍රහය.

නෙස්ලේ පෞද්ගලිකත්වය සඳහා වූ ප්‍රතිපත්තිය.

## මානව අයිතීන් සහ ශ්‍රමික ක්‍රියාකාරකම්

### 4
**අප ව්‍යාපාරික කටයුතුවල මානව අයිතීන්.**

එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුම.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 87, 138, 182 සම්මුතීන්.

ළමා අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය: 32 වගන්තිය.

බහු ජාතික ව්‍යාපාරයන් 2000* සඳහා ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයේ නිර්නායකයන්.

බහු ජාතික ව්‍යාපාරයන් 2006* සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශන

## අප සේවක පිරිස

### 5
**නායකත්ව සහ පෞද්ගලික වගකීම්.**

නෙස්ලේ කළමනාකරණ සහ නායකත්ව මූලධර්ම

නෙස්ලේ ව්‍යාපාර පාලන නීති සංග්‍රහය,

නෙස්ලේ මානව සම්පත් ප්‍රතිපත්තිය.

## සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන්

## පරිසරය

6
**සේවා ස්ථාන තුළ සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යාරක්ෂාව.**

සේවා ස්ථාන තුළ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යාරක්ෂව පිළිබඳ නෙස්ලේ ප්‍රතිපත්ති.

7
**සැපයුම්කරු සහ ගනුදෙනුකරු සබඳතා**

නෙස්ලේ සැපයුම්කරු නීති සංග්‍රහය.

8
**කෘෂි සහ ග්‍රාමීය සංවර්ධනය.**

පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යාම පිළිබඳ නෙස්ලේ ප්‍රතිපත්තිය.

9
**පරිසරය සුරැකීම.**

පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යාම පිළිබඳ නෙස්ලේ ප්‍රතිපත්තිය.

10
**ජලය.**

පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යාම පිළිබඳ නෙස්ලේ ප්‍රතිපත්තිය.

ජලය සඳහා වන නෙස්ලේ කැපවීම.

* භාහිර දත්ත

# සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ කැපවීම.

නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්මයන් වසර 140 ක කාලාන්තරයක් තුළ වර්ධනය කරන ලද අප සමාග මේ සංස්කෘතියේ පදනමයි. හෙන්රි නෙස්ලේ විසින් තම සාර්ථක කිරි සහ ධාන්‍ය අඩංගු ළදරු ආහාරය වූ "ෆරායන් ලැක්ටී" ප්‍රථමයෙන් සකස් කළ ද සිට අප කොටස්කරුවන් සඳහා දිගු කාලීන සාර්ථකත්වයක් ළඟා කර දෙන අන්දමින් අප අපේ ව්‍යාපාරය මූලික ප්‍රතිපත්ති පද්ධතියන් මත ගොඩ නැගීම සිදු කළ අතර සුදුසු සෑම නීතිමය අවශ්‍යතාවයන් සඳහාම අනුගත වෙමින් අප සියලු ක්‍රියාකාරකම්වල තිරසාර බව සහතික කරණු පමණක් නොව, ඊට අමතරව සමාජය සඳහා සැලකිය යුතු මෙහෙවරක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයද හඳුනාගෙන ඇත. නෙස්ලේ තුළ අප මෙය හඳුවන්නේ හවුල් වටිනාකම් නිර්මාණය කිරීම ලෙසය.

අප නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්මයන් මුල්වතාවට වසර 1998 දී ඒකාබද්ධ ලේඛනයක් ලෙස ප්‍රකාශයට පත් කළද ඉන් බොහෝ ඒවා ඊට වසර ගණනාවකට පෙර තනි තනි වශයෙන් ස්ථාපනය කොට තිබිණ. මෙම ව්‍යාපාර මූලධර්මයන් ස්ථාවර ලෙස ස්ථාපනය කරන අතරතුරම ඒවා වෙනස් වන ලෝකයට ගැළපෙන අයුරින් විකසනය කිරීම සහ නැවත සකස් කිරීමද අඛණ්ඩව සිදු විය. උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුමේ මූල ධර්ම දහයම ඒවා නිර්මාණය කළ සැනින් නෙස්ලේ තුළට සංයුක්ත කරන ලද අතර වර්තමානය සඳහා ක්‍රියාවේ යෙදවීමද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම නවතම සංස්කරණය පෙර සංස්කරණ දෙකට වඩා සෑහෙන වෙනස්කම්වලින් යුක්ත වන අතර ව්‍යාපාර මෙහෙයුම්වල මූලධර්ම දහය, සවිස්තරාත්මක මූලධර්ම, ප්‍රතිපත්ති, ප්‍රමිතීන් හා මෙහෙයුම් නිර්නායකයන් දැනටමත් පවතින පිටපත් සමග විශේෂයෙන්ම සම්බන්ධ කොට තිබේ. මේ මගින් එක් එක් මූලධර්මයන් හි ලියවිලි වඩාත් සංක්ෂිප්තව ලබාදීමේ අවස්ථාව සැලසෙන අතර ඒවාට අදාළ සවිස්තර World Wide Web ඔස්සේ සැපයීමද සිදු කරයි. මීට අමතරව මුල් වතාවට මූලධර්මයන් පිළිබඳ සිතියමක් සහ අදාළ සමාගම් තක්සේරුවන් පිළිබඳ විශ්ලේෂණයක්ද ලියවිල්ල ආරම්භයේ අඩංගු කොට තිබේ.

සමාගමේ ව්‍යාපාරයන් තුළට දැඩි ලෙස අනුගත වූ සංස්කෘතියක වැදගත්කම පිළිබඳව අපි විශ්වාස කරන්නෙමු. සාමූහික ව්‍යාපාර මූල ධර්මයන් සහ උපකාරක ලියවිලි මෙම කැපවීම පිළිබිඹු කරන අතර නෙස්ලේ වෙළෙඳ නාමය පිළිබඳව අපේ පාරිභෝගිකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් තබා ඇති විශ්වාසයද සුරැකී ඇත. අප අභ්‍යන්තර රෙගුලාසි රටේ නීතියට දැඩි ලෙස අනුකූල අයුරින් සකසා ඇති අතර ඒවා නීතිය ඉතා ලිහිල් අවස්ථාවන් හි සහ ඇතැම්විට අදාළ නීති නොමැති අවස්ථාවන් හි පවා අපේ ක්‍රියාවන්ට මග පෙන්වයි. නෙස්ලේ වෙතින් පාරභෝගික අවශ්‍යතා ඉටු කිරීමට වඩා වැඩි දෙයක් ඉටුවේ. අපේ සේවක මණ්ඩලය සඳහා ඉතා පැහැදිලි මග පෙන්වීමක් ලබා දෙමින් සමස්ථ සමාගමට අදූල වන ස්ථිර මූල ධර්ම තිබිය යුතුය.

නෙස්ලේහි සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස අප, සමස්ත සමාගම මෙම මූල ධර්මයන්ට අනුව කළමනාකරණය කිරීම පිළිබඳව තහවුරු කිරීමට කැපවී සිටින අතර ලොව වටා සිටින අප සියළුම සේවකයින් ඒවා පිළිපැදීම අවශ්‍යය. එමෙන්ම අප අඛන්ඩ වර්ධනය සඳහාද කැපවී සිටින අතර සාමූහික ව්‍යාපාර මූල ධර්ම වල ඕනෑම අංශයක් සඳහා බාහිරව දයක වීමටද විවෘතය.





පීටර් බ්‍රාබෙක් ලෙට්මේත්
අධ්‍යක්ෂ මණ්ඩල සභාපති

පෝල් බුල්කේ.
ප්‍රධාන විධායක නිලධාරී

# ස්ථාවර පැවැත්ම සඳහා වූ පදනම සහ හවුල් වටිනාකම් නිර්මාණය කිරීම

මූලධර්ම මත පදනම් වූ සමාගමක් ලෙස නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්ම මගින් අප විසින් සිදු කරන සියලුම ක්‍රියාවන්හි පදනම නිර්මාණය කරනු ලබයි. නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්ම සහ ඒ ඒ මූලධර්මයන් හා සම්බන්ධ සුවිශේෂි ප්‍රතිපත්ති වලට අනුකූල වීමේදී සියලුම තරාතිරම්වල සේවකයන් සහ ඔවුන්ගේ භාවිතයන් සඳහා දක්වනු ලබන සැලකිල්ලේ කිසිදු වෙනසක් සිදුනොවන අතර ඔවුන්ගේ ක්‍රියා පටිපාටින් නිරන්තර නිරීක්ෂණයට හා විගණනයට ලක්වේ.

පහත වගුවේ සඳහන් ආකාරයට නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූලධර්ම හා අනුකූලතාවයක් ඇති කර ගැනීම, පාරිසරික ස්ථාවර භාවය පවත්වා ගැනීමට සහ හවුල් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන සමාගමේ කැපවීමේ පදනම වේ.

හවුල් වටිනාකම් නිර්මාණය කිරීම අප ව්‍යාපාරයන්හි යෙදෙන මූලික ස්වභාවය වේ. ඉන් අප කොටස්කරුවන් සඳහා දිගු කාලීන අගයන් නිර්මාණය කෙරෙන අතර ඉන් සමාජය තුළ ද වටිනාකම් අප විසින් නිර්මාණය කළ යුතු වේ. නමුත් අප ව්‍යාපාරික මූලධර්ම හා අනුකූල වීමට අපොහොසත් වුවහොත් කොටස්කරුවන් සහ සමාජය කෙරෙහි වටිනාකම් නිර්මාණය කළ නොහැක.

එමෙන්ම, හවුල් වටිනාකම් ගොඩ නැගීම, අනුකූල වීම ස්ථාවර භාවයෙන් ඔබ්බට ගිය එකකි. ඕනෑම ව්‍යාපාරයක් දිගු කාලීනව පවත්වාගෙන යාම කෙරෙහි සිතමින් ව්‍යාපාර මූල ධර්ම අනුගමනය කරයි නම් සේවකයන් සඳහා රැකියා, පොදු සේවාවන් සඳහා රජයට ගෙවන බදු සහ සමස්ත වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් ආදි ක්‍රියාවන් වලදී එහි ක්‍රියාකාරකම් හරහා කොටස්කරුවන් සහ සමාජය සඳහා වටිනාකම් නිර්මාණය වනු ඇත.

නමුත් සාමූහික වටිනාකම් ගොඩ නැගීම මින් පියවරක් ඔබ්බට ගිය එකකි. සමාගමක් තම අවධානය යොමු කළ යුතු අංශ කල්පනාකාරීව හඳුනා ගනී. එනම් (a) කොටස් කරුවන්ගේ උනන්දුව හා සමාජයේ ඇති තදබල බාධාවන් (b) දෙපාර්ශ්වය සඳහාම උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ලෙස අගයන් නිර්මාණය කිරීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගම කුසලතා සහ ප්‍රාග්ධන යන අංශ දෙක සඳහාම සම්පත් ආයෝජනය කරනු ලබන අතර එම අංශ සමාජයේ අදාල පාර්ශ්වකරුවන් සමග සහයෝගීතාවය අපේක්ෂා කෙරේ.

නෙස්ලේ තුළ අප වටිනාකම් දාමය විශ්ලේෂණය කිරීම තුළින් සමාජය සමග ඒකාබද්ධ වටිනාකම් ගොඩනැගීම සඳහා උපරිම විභවයක් ඇති අංශ ලෙස පෝෂණය, ජලය හා ග්‍රාමීය සංවර්ධනය හඳුනාගෙන ඇත. මෙම ක්‍රියාකාරකම් අප ව්‍යාපාරික උපාය මාර්ගයන් වල හරය වන අතර අප ව්‍යාපාරික මෙහෙයුම් කරනු ලබන රටවල ජනතාවගේ සුබ සාධනය සඳහා අත්‍යවශ්‍ය වේ.

අවධානයට ලක්ව ඇති මෙම අංශවල ධනාත්මක බලපෑමක් කෙරෙහි කළ හැකි බාහිර පාර්ශ්වකරුවන්ගේ දායකත්වය සහ හවුල්කාරත්වයද අපි අපේක්ෂා කරන්නෙමු. කෙසේ වුවද සාමූහික සමාජ වගකීම්වල නිරතවීම පරාර්ථකාමය පිළිබිඹු කරන්නක් නොවේ. එය අප මෙහෙයුම් කරනු ලබන රටවල ජනතාවට ඒකාබද්ධ ප්‍රතිලාභ ලැබීම සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් සහ සහයෝගීතාවයන් දියත් කිරීමකි.

මෙමගින් නෙස්ලේ ඉතා දීර්ග කාලීන දැක්මක් සහිත ව්‍යාපාර සංවර්ධනයක් පවත්වාගෙන යන අතර මූල ධර්ම පදනම් කරගත් චර්යාවන් වෙත බැඳී සිටින නිර්මාණාත්මක දායකත්වයක් ඇති බාහිර පාර්ශ්වකරුවන් සමග සංවාද සාදරයෙන් පිළිගනී. මේ සඳහා රාජ්‍ය හා නියාමන අධිකාරි ආයතන, අන්තර් රාජ්‍ය සංවිධාන, අධ්‍යන සහ වෘත්තීය අංශ, සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ඇතුළත්ය.



# ව්‍යාපාර මෙහෙයුම් මූලධර්ම දහය

## පාරිභෝගිකයන්

### 1
**පෝෂණ, සෞඛ්‍ය සහ සුවතාවය**

අප මූලික අරමුණ වන්නේ රසවත් සහ සෞඛ්‍ය ජනක ආහාර හා පාන වර්ග ලබාදෙමින් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා දිරිගන්වමින් සෑම පාරිභෝගිකයකුගේම ජීවිතවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමය. අප මෙය ප්‍රකාශ කරන්නේ අප සාමූහික දැක්ම වන Good Food, Good Life ඔස්සේය.

### 2
**තත්ත්ව ආරක්ෂණය සහ නිෂ්පාදන සුරක්ෂිතතාවය**

ලොව ඕනෑම තැනක නෙස්ලේ නාමය, පාරිභෝගිකයින් සඳහා නිෂ්පාදනවල සුරක්ෂිතතාවය සහ ඉහළම ප්‍රමිතිය සඳහා වූ ප්‍රතිඥාව නියෝජනය කරනු ලබයි.

### 3
**පාරිභෝගික සන්නිවේදනය**

තෝරා ගැනීම් පිළිබඳව දැනුවත් වීමට තමාට ඇති අයිතිය පිළිබඳ පාරිභෝගිකයා බලගන්වමින් සහ සෞඛ්‍ය ජනක ආහාර ප්‍රවර්ධනය කරමින් විශ්වාසනීයත්වයකින් සහ වගකීමක් සහිතව පාරිභෝගිකයා වෙත සන්නිවේදන කටයුතු කිරීමට කැපව සිටී. එසේම අපි පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය ගරු කරන්නෙමු.

## මානව අයිතින් සහ ශ්‍රමික කටයුතු

### 4
**අපගේ ව්‍යාපාර කටයුතු තුළ වන මානව අයිතීන්.**

එක්සත් ජාතීන්ගේ ගෝලීය ප්‍රඥප්තිය (UNGC) මානව අයිතීන් සහ ශ්‍රමිකයින් සඳහා වන මෙහෙයුම් මූලධර්ම සඳහා අප අපේ පූර්ණ සහාය දක්වනු ලබන අතර අප ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින්. විශිෂ්ට මානව අයිතීන් සහ ශ්‍රමික ක්‍රියාකාරකම් පිළිබඳ ආදර්ශයක් සැපයීම ඉලක්ක කොට සිටින්නෙමු.

## අපේ සේවකයන්

### 5
**නායකත්වය සහ පෞද්ගලික වගකීම**

අප සාර්ථකත්වය පදනම්ව ඇත්තේ අප සේවක මණ්ඩලය මතය. එකිනෙකා වෙත අප නිසි ගෞරවය පුද කරන අතර පුද්ගලික වගකීම් පිළිබඳ හැඟීමක් සෑම කෙනෙකු තුළින්ම බිහිවේ යැයි අපේක්ෂා කරමු. අප නිතරම අපගේ වටිනාකම් වලට ගරු කරන නිසි සහ උද්‍යෝගිමත් පුද්ගලයින් සේවය සඳහා බඳවාගනු ලබන අතර ඔවුන්ගේ සංවර්ධනය හා දියුණුව උදෙසා එක හා සමාන අවස්ථාවන් ලබා දෙමින්, ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් කිනම් අන්දමේ විෂමතාවයකට හෝ වද හිංසාවකට ලක් වීම හෙලා දකින්නෙමු.

### 6
**සේවා ස්ථාන තුළ සෞඛ්‍යය සහ සුරක්ෂිත භාවය**

සේවාවට අදාළ හදිසි අනතුරු, ආබාධ සහ රෝගී තත්ත්වයන් වැළැක්වීම සඳහා සහ වටිනාකම් දමය හා සම්බන්ධ සේවකයන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් අය ආරක්ෂා කිරීම සඳහාද අපි කැපවීමෙන් කටයුතු කරන්නෙමු.

## සැපයුම්කරුවන් සහ ගනුදෙනුකරුවන්

## පරිසරය

### 7

**සැපයුම්කරු සහ ගනුදෙනුකරු සමග සම්බන්ධතා**

නිරන්තරයෙන්ම අවංකත්වය, නිර්ව්‍යාජ බව සහ සාධාරණත්වය ප්‍රදර්ශනය කරමින් සහ කේවල් කළ නොහැකි අපගේ සම්මතයන්ට අනුකූල වෙමින් කටයුතු කරන ලෙස අප සැපයුම්කරුවන්, නියෝජිතයින්, උප කොන්ත්‍රාත්කරුවන් සහ ඔවුන්ගේ සේවකයින්ගෙන් අපි ඉල්ලා සිටිමු. ඒ ආකාරයෙන් අපි අපේ ගනුදෙනුකරුවන් වෙනුවෙන්ද කැපවන්නෙමු.

### 8

**කෘෂි සහ ග්‍රාමීය සංවර්ධනය**

කෘෂි නිපැයුම්, ගොවි ජනතාවගේ සමාජීය හා ආර්ථික තලයන් වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම ග්‍රාමීය ප්‍රජාව සහ නිපැයුම් ක්‍රියා පිළිවෙත පරිසර සමතුලිතතාවය වඩාත් සුරැකෙන අයුරින් සිදු කිරීම සඳහා අපේ දායකත්වය සපයන්නෙමු.

### 9

**පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යාම**

අපි පරිසරය සුරැකෙන සහ නිසි අන්දමින් පවත්වාගෙන යා හැකි ලෙස ව්‍යාපාර කටයුතුවල යෙදීම සඳහා කැපවී සිටිමු. නිෂ්පාදන ජීවන චක්‍රයේ සෑම පියවරකදීම නැවත අලුත් කළ හැකි ස්වභාවික සම්පත් යොදාගැනීම කෙරෙහි තදින්ම අවධානය යොමු කරමින් අපද්‍රව්‍ය නිපදවෙන ප්‍රමාණය ‘0’ ඉලක්ක ගත කර ඇත.

### 10

**ජලය**

අපි නිරතුරුවම සම්පත් ක්ෂය වීම වැළකෙන අයුරින් ජලය භාවිතා කිරීමට සහ ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන්ම කැපව සිටින්නෙමු. වර්ධනය වෙමින් පවතින ජල අභියෝගයකට ලොව මුණ පා ඇති බව අප හඳුනාගෙන ඇති අතර ජලය භාවිතා කරන්නන් සියලු දෙනා ලොව සම්පත් වගකීමකින් යුතුව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව තිබේ.

# සාමූහික ප්‍රතිපත්ති සඳහා සවිස්තරාත්මක සටහන් හා සම්බන්ධතාවයන්

## පාරිභෝගික

## 1

**පෝෂණය, සෞඛ්‍ය සහ සුවතාවය**

**අප මූලික අරමුණ වන්නේ රසවත් සහ සෞඛ්‍ය ජනක ආහාර හා පාන වර්ග ලබාදෙමින් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා දිරිගන්වමින් සෑම පාරිභෝගිකයකුගේම ජීවිතවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමය. අප මෙය ප්‍රකාශ කරන්නේ අප සාමූහික දැක්ම වන Good Food, Good Life ඔස්සේය.**

පෝෂණය, සෞඛ්‍ය සහ සුවතාවය සඳහා වන අප කැපවීම තුළින් අපගේ නිෂ්පාදනයන්හි පෝෂණීය අගය වැඩි දියුණු කිරීමට පියවර ගන්නා අතරම එහි රසය හා ආස්වාදය ඉහළ නැංවීමටද කටයුතු කරනු ලැබේ. එසේම අප පාරිභෝගිකයාට තම ආහාර තෝරා ගැනීම පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන් සවි බල ගන්වමින් හා දිරිමත් කරවන ලෙස වෙළඳ නාම සන්නිවේදනයේ හා තොරතුරු සංවර්ධනයේද යෙදී සිටින්නෙමු.

කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Principles on Nutrition, Health and Wellness* බලන්න.

## 2

**තත්ත්ව ආරක්‍ෂණය සහ නිෂ්පාදන සුරක්ෂිතතාවය**

**ලොව ඕනෑම තැනක නෙස්ලේ නාමය, පාරිභෝගිකයින් සඳහා නිෂ්පාදනවල සුරක්ෂිතතාවය සහ ඉහළම ප්‍රමිතිය සඳහා වූ ප්‍රතිඥාව නියෝජනය කරනු ලබයි.**

අපගේ කැපවීම ඕනෑම නිෂ්පාදනයක ආරක්ෂාව පිළිබඳ සාකච්ඡා කරමින් සිටීම නොවේ. අප 'තත්ත්ව ප්‍රතිපත්තීන්' විශිෂ්ටත්වය සඳහා අප තුළ පවත්නා අත්‍යවශ්‍ය භාවය සම්පිණ්ඩනය කරනු ලබන්නේ

- පාරිභෝගික අපේක්ෂාවන්ට සහ වැඩි කැමැත්තට ගැළපෙන ආකාරයේ නිෂ්පාදන හා සේවාවන් සපයමින් විශ්වාසයක් ගොඩනැගීම සඳහා සහ
- ආහාර සුරක්ෂිතතාවය, නියාමනය සහ ප්‍රමිතීන්ට අදාල සියලු අභ්‍යන්තර හා බාහිර අවශ්‍යතාවයන්ට අනුකූල වීමටත්ය

තත්ත්වය සඳහා සෑම දෙනාගේම කැපවීම අවශ්‍ය වේ. නිරන්තරයෙන් වැඩි දියුණු කරමින් ඉහළම තලයේ තත්වයක් වෙත එළඹීම සඳහා අපි අපටම අඛණ්ඩව අභියෝග කරන්නෙමු. අප එක හා සමාන ආහාර සුරක්ෂිත තාවය පිළිබඳ ඉහළම තත්වයක් අප මෙහෙයුම් කරනු ලබන සෑම රටකම පවත්වාගෙන යන්නෙමු.

අප තත්ත්ව කළමණාකරන පද්ධතිය ඔස්සේ විශිෂ්ට තත්වයකින් යුත් නිෂ්පාදන සැපයීම පිළිබඳව සහතික වන්නෙමු.

කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Quality Policy* බලන්න.

## 3

**පාරිභෝගික සන්නිවේදනය**

**තෝරා ගැනීම් පිළිබඳව දැනුවත් වීමට තමාට ඇති අයිතිය පිළිබඳ පාරිභෝගිකයා බලගන්වමින් සහ සෞඛ්‍ය ජනක ආහාර ප්‍රවර්ධනය කරමින් විශ්වාසනීයත්වයක් සහ වගකීමක් සහිතව පාරිභෝගිකයා වෙත සන්නිවේදන කටයුතු කිරීමට කැපව සිටී. එසේම අපි පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය ගරු කරන්නෙමු.**

අප ප්‍රධාන ව්‍යාපාරික උපාය මාර්ගයන් ගොඩනැගී ඇත්තේ පාරිභෝගිකයින්ට සමබර, සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ගැනීම සඳහා සහාය ලබා දීම වටාය. නෙස්ලේ පාරිභෝගික සන්නිවේදන මූලධර්මයන්හි අධි පරිභෝජනය සඳහා පාරිභෝගිකයින් දිරිමත් නොකරන අයුරින් ආහාරවල නිවැරදි නියෝජනය සහ නිරූපණයද ඇතුලුව සියලුම පාරිභෝගිකයින් සඳහා අලෙවි සන්නිවේදනයෙහි වන අනිවාර්ය නීති රීති අඩංගුවේ. එසේම විශේෂ ප්‍රතිපත්ති අනුව වයස අවුරුදු 6න් පහළ ළමුන් සඳහා කිසිදු ප්‍රචාරක කටයුත්තක් හෝ අලෙවි ක්‍රියාකාරකමක් සිදු නොවේ. වයස අවුරුදු 6-12ත් අතර ළමුන් සඳහා සන්නිවේදනය කිරීමේදී අදාළ නිෂ්පාදනවල ශක්ති ප්‍රමාණය සහ සීනි, ලුනු, සංතෘප්ත මේදය, සහ ට්‍රාන්ස් ෆැටි අම්ල වැනි සෞඛ්‍ය තත්ත්වයට සංවේදී සංඝටක වල පැහැදිලි ප්‍රමාණයන්ද සඳහන් කරන ලෙසට සීමාවන් පනවා තිබේ. ළමුන් සඳහා වන අප සන්නිවේදන මූල ධර්ම විශේෂයෙන් ඉලක්ක වන්නේ ළමුන් රැක ගැනීම කෙරෙහිය. එබැවින් එම සන්නිවේදන කටයුතු වලදී නොමග යවන සුළු දැන්වීම් පළ නොවීම පිළිබඳව තහවුරු කරමින් දෙමව්පිය අධිකාරිත්වයට හානියක් සිදු නොවන ලෙස හෝ සාර්ථකත්වය පිළිබඳ යථාර්ථවාදී නොවන අපේක්ෂාවන් ජනනය නොවන පරිදි යම් නිපැයුම් අත්‍යවශ්‍ය බවට හෝ මිල අඩු බවට හැඟීමක් ඇති නොවන සේ එය සිදු කෙරේ. *The Nestle Policy on Nutrition and Health Claims* මගින් විද්‍යානුකූලව සහාය දක්වනු ලබන *Health Claims* වෙත අප ක්‍රියාකාරකම් මෙහෙයවනු ලබයි. කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Consumer Communication Principles, The Nestle Policy on Nutrition and Health Claims* සහ *The Nestle Nutritional Profiling System* බලන්න.

### ළදරු ආහාර අලෙවිකරණය

ළදරු ජීවිත වලට සුදුසුම ආරම්භයක් ලබාදීම සාර්ථකව ඉටු කර ගැනීම සඳහා වඩාත් සුදුසු ඕනෑම දෙයක් වෙනුවෙන් සහාය දීමට අප කැප වන්නෙමු. මෙහි අරුත අනෙක් ඕනෑම විකල්ප ළදරු ආහාරයකට වඩා මව් කිරි යෝග්‍ය බව අප නිර්දේශ කරන බවය. අප අරමුණ වනුයේ මව්කිරි වෙනුවට විකල්පයක් සොයන අයට සම්පූර්ණ යොදය අඩංගු කිරි වැනි අනතුරුදායක හා නුදුසුදු මව්කිරි ආදේශකයන් වෙනුවට ළදරු සෞඛ්‍යයට හිතකර ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වට්ටෝරු නිෂ්පාදන ඉදිරිපත් කිරීමය. එසේම ළදරුවන් සඳහා බොහෝ විට ලබා දෙන අඩු පෝෂණ අගයකින් යුතු ආහාර වෙනුවට

ප්‍රශස්ත වර්ධනය හා ළමා සංවර්ධනය සඳහා දායක වන ධාන්‍ය ආහාර, ළදරු ආහාර සහ කිරි වර්ග වැනි ආහාර වර්ග ඉදිරිපත් කිරීමද අපගේ අරමුණකි.

අප ළදරු ආහාර අලෙවි කරනු ලබන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) සාමාජික රටවල් විසින් පිළිපදිනු ලබන ලෝක සෞඛ්‍ය සංවිධානයේ මව්කිරි ආදේශක අලෙවි කිරීමේ ජාත්‍යන්තර නීති සංග්‍රහයට අනුවය. මීට අමතරව සංවර්ධනය වෙමින් පවතින රටවල රජයන් විසින් සිදු කළද නො කළද අප ස්වේච්ඡාවෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධාන නීති සංග්‍රහය පිළිපැදීමට කටයුතු කරන්නෙමු. රජය විසින් මේ පිළිබඳව නිරීක්ෂණයට ලක් කළද නොකළද සියල්ල නියම ප්‍රමිතීන්ට අනුව සිදුවන්නේදැයි සහතික කර ගැනීම සඳහා අප අපේම ක්‍රියාවලින් නිරීක්ෂණයට ලක් කරන්නෙමු. නෙස්ලේ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ නීති සංග්‍රහයට අනුකූලව කටයුතු කරන්නේද යන්න සොයා බැලීම සඳහා පිළිගත් සමාජ විගණන සමාග මක් ලවා විගණනයට භාජනය කරන අතර එම වාර්තා ප්‍රසිද්ධියට පත් කෙරේ.

කරුණාකර www.babymilk.nestle.com බලන්න.

## 4

### අප ව්‍යාපාරික කටයුතුවල මානව අයිතීන්

**එක්සත් ජාතීන්ගේ ගෝලීය ප්‍රඥප්තිය (UNGC) මානව අයිතීන් සහ ශ්‍රමිකයින් සඳහා වන මෙහෙයුම් මූලධර්ම සඳහා අප අපේ පූර්ණ සහාය දක්වනු ලබන අතර අප ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින්. විශිෂ්ට මානව අයිතීන් සහ ශ්‍රමික ක්‍රියාකාරකම් පිළිබඳ ආදර්ශයක් සැපයීම ඉලක්ක කොට සිටින්නෙමු.**

අප

- කිනම් අන්දමක හෝ ළමුන් සූරා කෑමේ ක්‍රියාවන්ට අප විරුද්ධය.
- පෞද්ගලිකත්වය මානව අයිතියක් ලෙස සලකන්නෙමු.
- මානව අයිතීන් උදෙසා වන දේශීය නීති රීති වලට ගරු කිරීම සහ ඒවා අනුගමනය කිරීම අපි අපේ සියලුම සමාගම් වෙතින් අපේක්ෂා කරමු. අපේම මූල ධර්මයන් හා නීති රීති දේශීය නීති වලටත් වඩා දැඩි වන අතර වඩා දැඩි නීතිය ක්‍රියාවේ යොදවනු ලබයි.
- තම අධිකරණ අධිකාරිය තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා රජයන් මූලික වශයෙන් වගකිව යුතුය යන කරුණු නොතකා මානව හිමිකම් සඳහා ගරු කිරීමට සමාගම් සතු වගකීම පිළිබඳව හඳුනාගෙන ඇත්තෙමු.

අපි පිළිගනිමු

- ඇසුර සඳහා ඇති නිදහස සහ සාකච්ඡා මාර්ගයෙන් යමක් විසඳා ගැනීමට ඇති අයිතිය ප්‍රබලව පිළිගනිමු. (UNGC මූල ධර්ම 3)
- සෑම ආකාරයකම බල කිරීම් සහ අනිවාර්ය සේවාවන් පිටු දැකීම. (UNGC මූල ධර්ම 4)
- නියත වශයෙන්ම ළමා ශ්‍රමිකත්වය අහෝසි කිරීම. (UNGC මූල ධර්ම 5)
- රැකියාව හා සම්බන්ධ සියලු විෂමතාවයන් දුරු කිරීම. (UNGC මූල ධර්ම 6)
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලික සම්මුති 8 වෙත අපි බැඳී ඇත්තෙමු. එනම්

87 වන සම්මුතිය - ඇසුර සඳහා ඇති නිදහස සහ සංවිධානය වීම සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීම (1948), එමෙන්ම 138 වන සම්මුතිය - රැකියාවේ නියැලීම සඳහා වන අවම වයස සහ 182 වන සම්මුතිය - එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මත පදනම් වූ ළමා ශ්‍රමිකත්වය සම්බන්ධ අයහපත් ස්වභාවයන් (32 වන ඡේදය) ආදියයි. තව දුරටත් අප විසින් බහු ජාතික සමාගම් සහ සමාජ ප්‍රතිපත්ති (ILO) වලට අදාල මූල ධර්ම අඩංගු ත්‍රෛපාක්ෂික ප්‍රකාශනය (2006 මාර්තු) සහ බහු ජාතික සමාගම් මාර්ගෝපදේශනය (2006 ජූනි) (OECD) පිළිගනු ලැබේ.

## අප සේවක පිරිස

# 5

### නායකත්වය සහ පෞද්ගලික වගකීම

**අප සාර්ථකත්වය පදනම්ව ඇත්තේ අප සේවක මණ්ඩලය මතය. එකිනෙකා වෙත අප නිසි ගෞරවය පුද කරන අතර පුද්ගලික වගකීම් පිළිබඳ හැඟීමක් සෑම කෙනෙකු තුළින්ම බිහිවේ යැයි අපේක්ෂා කරමු. අප නිතරම අපගේ වගකීම් වලට ගරු කරන නිසි සහ උද්‍යෝගිමත් පුද්ගලයින් සේවය සඳහා බඳවාගනු ලබන අතර ඔවුන්ගේ සංවර්ධනය හා දියුණුව උදෙසා එක හා සමාන අවස්ථාවන් ලබා දෙමින්, ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් කිනම් අන්දමේ විෂමතාවයකට හෝ වධ හිංසාවකට ලක් නොකරන්නෙමු.**

#### නෙස්ලේ කළමනාකරන සහ නායකත්ව මූල ධර්ම

කළමණාකාරිත්වය සහ නායකත්වය සාර්ථක කරගැනීමට මෙන්ම සියලු සේවකයන් පිළිගත යුතු යැයි අපේක්ෂිත සංස්කෘතිය සහ මූලික වටිනාකම් කළමණාකාරිත්ව සහ නායකත්ව මූල ධර්ම මගින් විස්තර කෙරේ. කරුණාකර www.nestle.com/policie වෙබ් අඩවියට පිවිස *The Nestle Management and Leadership Principles* බලන්න.

#### Nestlé Code of Business Conduct

ව්‍යාපාර මෙහෙයවීම පිළිබඳ නෙස්ලේ ව්‍යාපාර පාලන නීති සංග්‍රහය, නීතියට අනුකූල වීම, උනන්දුව සඳහා වූ අරගලය, විශ්වාසය බිඳීම් සහ සාධාරණව ගනුදෙනු කිරීම, අල්ලස්, දූෂණ (UNGC මූල ධර්ම 10) විෂමතාවය සහ වධ හිංසා සහ අවංකත්වය ආදියෙන් සමන්විත ප්‍රධාන අංශ වල කේවල් කළ නොහැකි අවම ප්‍රමිතීන් විදහා දක්වයි. අප නිදහස් තරගකාරිත්වයේ වැදගත්කම විශ්වාස කරනු ලබන අතර සියලු තත්ත්වයන් වලදී අවංකව කටයුතු කිරීම සඳහා කැපවෙමු. කරුණාකර www.nestle.com/policie වෙබ් අඩවියට පිවිස *The Nestle Code of Business Conduct* බලන්න.

අප මානව සම්පත් ප්‍රතිපත්ති තුළින් එකිනෙකාට අදළ වන අන්‍යොන්‍යය ගෞරවය, විශ්වාසය සහ විනිවිද භාවය ආදී ආකල්පයන් පිළිබඳව පැහැදිලිව විස්තර කරනු ලබන අතර විවෘත සන්නිවේදනයක් සහ සහයෝගීතාවයක් සඳහාද දිරිගන්වනු ලබයි. එසේම අප දිගු කාලීන සාර්ථකත්වය රඳා පවතින්නේ වඩාත් සුදුසු හා විශිෂ්ට සේවකයන් ආකර්ෂණය කරගැනීමේ, සංවර්ධනය කිරීමේ, ආරක්ෂා කිරීමේ සහ රඳවා තබා ගැනීමේ අප සතු හැකියාව මත බවද විශ්වාස කරන්නෙමු.

සේවක අයිතීන්ට සහ විෂමතාවය පිටු දැකීමට අදළ වන ජාත්‍යන්තර සම්මුතීන්ට ගරු කරන අප සම්භවය, ජාතිය, ආගම, ජන වර්ගය, ලිංග භේදය වයස, ලිංගික හැඩගැස්ම ආදී හේතූන් මත අසාධාරණයට ලක් කිරීම හෝ ඉහත සඳහන් ඕනෑම සාධකයක් හෝ වෙනත් සාධකයක් වෙනුවෙන් සිදුකරන ඕනෑම ආකාරයක වාචික හෝ කායික පීඩාවන් නො ඉවසමු. සේවකයන්ගේ ඇසුර සඳහා වන නිදහස අප අනුමත කරන අතර වෘත්තීය සමිති හෝ අනෙකුත් ආකාරයේ සංවිධාන හරහා සාකච්ඡා මාර්ගයෙන් යමක් විසඳා ගැනීමට ඇති අයිතිය ද අපි හඳුනාගෙන ඇත්තෙමු. (UNGC මූල ධර්ම 3) පෞද්ගලිකත්වය සඳහා වන අප සේවකයින්ගේ අයිතිය අපි ගරු කරන්නෙමු.

# 6

### සේවා කාලය තුළ සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යාරක්ෂාව

**සේවාවට අදළ හදිසි අනතුරු, ආබාධ සහ රෝගී තත්ත්වයන් වැළැක්වීම සඳහා සහ වටිනාකම් දමය හා සම්බන්ධ සේවකයන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් අය ආරක්ෂා කිරීම සඳහාද අපි කැපවීමෙන් කටයුතු කරන්නෙමු.**

සේවයේ යෙදී සිටින විට ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිපත්ති මගින් අප සංස්කෘතියේ කේවල් කළ නොහැකි ප්‍රමුඛත්වයක් ලෙස සුරක්ෂිත භාවය ස්ථාපනය කොට ඇත. ආරක්ෂාකාරී හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි සියලු දෙනා ක්‍රියාකාරී භූමිකාවක නිරතවීම සහ අප සේවකයින්, කොන්ත්‍රාත්තරුවන් මෙන්ම ව්‍යාපාරයට අදළ හෝ බලපාන අනෙකුත් පුද්ගලයින් අතර ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳව දැනුමක් සහ පුහුණුවක් ලැබීම ප්‍රවර්ධනය කිරීම පිළිගන්නා අතර සියලු දෙනාගෙන්ම එම තත්වය අපේක්ෂා කෙරේ.
ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථානයක් පිළිබඳව සහතික කිරීම සඳහා අප නෙස්ලේ වෘතීමය ආරක්ෂාව හා සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය මගින් අප කාර්ය ඵලයන් නිරීක්ෂණයට ලක් කරනු ලැබේ. කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Policy on Safety and Health at Work* බලන්න.

## සැපයුම්කරුවන් හා ගනුදෙනු කරුවන්

### 7

**සැපයුම්කරු සහ ගනුදෙනුකරු සමග සබඳතා**

**නිරන්තරයෙන්ම අවංකත්වය, නිර්ව්‍යාජ බව සහ සාධාරණත්වය ප්‍රදර්ශනය කරමින් සහ කේවල් කළ නොහැකි අපගේ සම්මතයන්ට අනුකූල වෙමින් කටයුතු කරන ලෙස අප සැපයුම්කරුවන්, නියෝජිතයින්, උප කොන්ත්‍රාත්කරුවන් සහ ඔවුන්ගේ සේවකයින්ගෙන් අපි ඉල්ලා සිටිමු. ඒ ආකාරයෙන් අපි අපේ ගනුදෙනුකරුවන් වෙනුවෙන්ද කැපවන්නෙමු.**

*නෙස්ලේ සැපයුම්කරු නීති සංග්‍රහය* මගින් අප සැපයුම් කරුවන්, ඒජන්තවරුන්, උප කොන්ත්‍රාත්කරුවන් හා ඔවුන්ගේ සේවකයින් සැලකිලිමත් විය යුතු සහ පිළිපැදිය යුතු අවම ප්‍රමිතීන් පිළිබඳව පැහැදිලිව විස්තර කෙරේ. එසේම සැපයුම් නීති සංග්‍රහයෙන් ව්‍යාපාරික අවංකත්වය, ස්ථාවර මෙහෙයුම්, කෘෂි ක්‍රියාකාරකම්, ශ්‍රමික ප්‍රමිතීන්, සුරක්ෂිත භාවය, සෞඛ්‍ය සහ පාරිසරික ක්‍රියාකාරකම් ආදී අවශ්‍යතාවයන් පිළිබඳව පැහැදිලිව විස්තර කෙරේ.

සැපයුම්කරු නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වේදැයි තහවුරු කර ගැනීම සඳහා නීති සංග්‍රහය සමග සැපයුම්කරු අනුකූලව කටයුතු කරන්නේදැයි සනාථ කර ගැනීමේ අයිතිය අප සතුව පවතී.
කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Supplier Code* බලන්න.

### 8

**කෘෂි සහ ග්‍රාමීය සංවර්ධන**

**කෘෂි නිපැයුම්, ගොවි ජනතාවගේ සමාජීය හා ආර්ථික තලයන්, ග්‍රාමීය ප්‍රජාව වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම නිපැයුම් ක්‍රියා පිළිවෙත පරිසර සමතුලිතතාවය වඩාත් සුරැකෙන අයුරින් සිදු කිරීම සඳහා අපි අපේ දයකත්වය සපයන්නෙමු.**

අප කර්මාන්ත ශාලා අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී ඒවා තරගකාරී ලෙස, නියමිත තත්වයෙන් සහ සෞඛ්‍ය ආරක්ෂිත ගුණාංගයන්ගෙන් තිබේදැයි තහවුරු කර ගැනීම සඳහා

- දිගු කාලීන නිෂ්පාදන කාර්යක්ෂමතාවයක්, ගොවීන්ට ප්‍රායෝගික ආදයම් සැපයීම සහ සැපයුම් කරුවන් කෘෂි කර්මාන්තය පිළිබඳව දැනුවත් කිරීම ආදිය සඳහා දයකත්වය සපයන අඛණ්ඩ කෘෂි ක්‍රියාකාරකම් වල අපි යෙදී සිටින්නෙමු.
- ආහාර සුරක්ෂිත තාවය, පරිසරය, කෘෂි ක්‍රියාකාරකම්, නිපැයුම් කාර්යක්ෂමතාව ආදිය සඳහා ඇති සුබවාදී බලපෑම් විද්‍යානුකූලව සනාථ කොට, පාරිභෝගිකයින්ගේ පිළිගැනීමට ලක්වන අවස්ථාවන් හීදී නව තාක්ෂණ යොදා ගැනීම් සහ ජීව විද්‍යාවෙන් සපයාදෙන අවස්ථාවන් ද ඇතුළත්ව කෘෂි විද්‍යාවේ වැඩි දියුණු කිරීම් සඳහාද අපි සහාය දක්වන්නෙමු.

The Sustainable Agriculture Initiative Nestle (SAIN) මගින් දිගු කාලීන තිරසාර බවක් සඳහා කෘෂි ක්‍රියාකාරකම්, ග්‍රාමීය සංවර්ධනය, සම්පත් සැකසුම හා ක්‍රියාකාරකම් වලට සහාය දැක්වීම සඳහා වගා කිරීමේ ක්‍රමවල අප නිරතවීම මෙහෙවනු ලබයි. කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Policy on Environmental Sustainability* බලන්න.

# පරිසරය

## 9

**පරිසරය සුරැකීම සහ පවත්වාගෙන යෑම**

**අපි පරිසරය සුරැකෙන සහ නිසි අන්දමින් පවත්වාගෙන යා හැකි ලෙස  ව්‍යාපාර කටයුතුවල යෙදීම සඳහා කැපවී සිටිමු. නිෂ්පාදන ජීවන චක්‍රයේ සෑම පියවරකදීම නැවත අලුත් කළ හැකි ස්වභාවික සම්පත් යොදාගැනීම කෙරෙහි තදින්ම අවධානය යොමු කරමින් අපද්‍රව්‍ය නිපදවෙන ප්‍රමාණය '0' ඉලක්ක ගත කර ඇත.**

අප පාරිසරික කාර්ය ඵලයන් වැඩි දියුණු කිරීම සඳහා අපි අඛන්ඩව ආයෝජනයන් සිදු කරන්නෙමු. The Nestle Policy on Environmental Sustainability හී එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුමේ පරිසරය පිළිබඳව මග පෙන්වන මූල ධර්ම 3ක් අඩංගුය (මූල ධර්ම 7, 8 සහ 9)
අප නිපැයුම් වල සහ ක්‍රියාකාරකම්වල පාරසරික බලපෑම් අවම කර ගැනීම සඳහා ගොවිපලවල සිට පාරිභෝගිකයින් දක්වා වන අපේ කොටස්කරුවන් සම්බන්ධ වන නිපැයුම් ජීවන චක්‍ර පිවිසුම් මගක් අපි අනුගමනය කරන්නෙමු. අප ප්‍රමුඛතාවය හිමි වන අංග 4 වන්නේ ජලය, කෘෂි අමුද්‍රව්‍ය, නිෂ්පාදනය සහ නිපැයුම් බෙදා හැරීම හා ඇසිරීමය. අප අපේ ප්‍රතිපත්තිය Nestle Environmental Management System ඔස්සේ ක්‍රියාවේ යොදවන්නෙමු.
පාරිසරික කාර්ය ඵලයන් සමාජයේ සෑම කොටසකම සාමූහික වගකීම සහ සහයෝගය ලැබිය යුත්තක් බව අපගේ විශ්වාසයයි. මේ සඳහා අප වගකීම් සීමාව තුළ අඛන්ඩව නායකත්වය සැපයීමට අපි අදිටන් කරගෙන සිටිමු. කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *The Nestle Policy on Environmental Sustainability* බලන්න.

## 10

**ජලය**

**අපි නිරතුරුවම සම්පත් ක්ෂය වීම වැළකෙන අයුරින් ජලය භාවිතා කිරීමට සහ ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන්ම කැපව සිටින්නෙමු. වර්ධනය වෙමින් පවතින ජල අභියෝගයකට ලොව මුණ පා ඇති බව අප හඳුනාගෙන ඇති අතර ජලය භාවිතා කරන්නන් සියලු දෙනා ලොව සම්පත් වගකීමකින් යුතුව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව තිබේ.**

ජලය නෙස්ලේහි අවධානය යොමු වූ විශේෂ විෂය පථයකි. The Nestle Commitment on Water මගින් වග කීමෙන් යුතුව ජලය භාවිතා කිරීම පිළිබඳව අප ප්‍රමුඛතාවයන් සහ අරමුණ පැහැදිලි කරයි. මෙම විෂය පථය ඔස්සේ අප නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන ජලය ප්‍රමාණය අඩු කිරීම, ප්‍රදේශයේ ජල සම්පත සුරැකීම සඳහා වන ක්‍රියාකාරකම් තහවුරු කිරීම, පරිසරයට මුදා හැරෙන ජලයේ පිරිසිදු බව තහවුරු කිරීම, ජලය සුරැකීම ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් ගොවීහු ඇතුළුව සැපයුම්කරුවන් සමග කටයුතු කිරීම සහ ජලය සුරැකීමට සහ ඒ හා සම්බන්ධ අනෙකුත් පාර්ශ්ව වෙත එළඹීම සඳහා අප උත්සාහයන් අඛණ්ඩව කරගෙන යනු ලැබේ. නෙස්ලේ එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුමේ ආරම්භක සාමාජිකයකු වේ.

නෙස්ලේ පාරිසරික කළමණාකරණ පද්ධතියට අනුව යමින් අපගේ ජල කාර්යක්ෂමතාව පිළිබඳව අප ජල සම්පත් කළමණාකරණ විශේෂඥයින් සහ කම්හල්වල සිටින පාරිසරික විශේෂඥයින් ලවා නිරීක්ෂණයට සහ වැඩි දියුණුවට ලක් කරනු ලැබේ.

තම මූලික අවශ්‍යතාවයන් සඳහා පිරිසිදු  ජලය ලබා ගැනීමට මිනිසාට ඇති අයිතිය අපි පිළිගන්නෙමු. කරුණාකර www.nestle.com/policies වෙබ් අඩවියට පිවිස *Every Drop Counts* බලන්න.

# විගණනය

නෙස්ලේ සාමූහික ව්‍යාපාර මූල ධර්මයන් නෙස්ලේහි සියලුම කළමණාකරුවන් හා සේවකයින් සඳහා අනිවාර්ය ප්‍රකාශනයන් වන අතර ව්‍යාපාර සැලසුම්, විගණන කටයුතු, කාර්ය ඵල සමාලෝචනයන් සඳහා ඒකාබද්ධ කර ඇත.

අනුකූල ක්‍රියා පිළිවෙල සකස් කර ඇති විශේෂිත ප්‍රතිපත්ති සහ අදාල නීති සංග්‍රහයන් සමග සාමූහික ව්‍යාපාර මූල ධර්ම සම්බන්ධ කර ඇත. නෙස්ලේ මූලධර්ම සහ ප්‍රතිපත්ති සටහන බලන්න. (මුල් කවරයේ ඇතුල් පැත්ත.)

තම සාමූහික ව්‍යාපාර මූල ධර්මයන්ට අදාළව නෙස්ලේ හි අනුකූලතාවය පැහැදිලි විගණන උපදෙස් මත පදනම්ව එහි අභ්‍යන්තර විගණකයින්ගේ නිරන්තර සමාලෝචනයන්ට ලක්වන අතර ඒවා සියලුම සේවකයින්ට Nestle S.A. internet වෙතින් විමසා බැලිය හැකි පරිදි ප්‍රකාශයට පත් කෙරේ. මානව සම්පත්, සුරක්ෂිත භාවය, සෞඛ්‍ය ආරක්ෂාව, පාරිසරක හා ව්‍යාපාරික අවංකත්වය සඳහා වන අනුකූලතාවය ස්වාධීන බාහිර විගණන ජාලයක සහාය ලබන අප CARE වැඩසටහන ඔස්සේ තක්සේරුවට ලක්වේ. හවුල් වටිනාකම් නිර්මාණය කිරීම පිළිබඳ අප වාර්තා නිරවද්‍යතාවය සහ වලංගු භාවය සඳහා ස්වාධීන බාහිර විගණකයින් ලවා විගණනයට ලක් කෙරේ.

නෙස්ලේහි අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව වැටහීමක් ලබා ගන්නා විට අප බාහිර විගණකයින් වන KPMG අප ව්‍යාපාර සමූහයේ සමස්ත ආයතනික පාලන රාමුව සඳහා සමූහ ව්‍යාපාර මූලධර්මන් ගැළපෙන්නේ කෙසේද යන්න පිළිබඳව සලකා බැලේ.

තීරණ සහ නිර්දේශයන් මාණ්ඩලීය විගණන කමිටුව හරහා Nestle S.A. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.